"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 2092601
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | CSWP/FIN-AP/03/FI/06 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date. | 2018.12. 24 | | |

## මුල්‍ය චක්‍රලේඛ 14/2018

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.),

### <u>රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන කටයුතුවලදී දේශීය ණයවර ලිපි විවෘත කිරීම.</u>

උක්ත මැයෙන් යුතුව භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2018.11.19 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 06/2018 හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා එවමි.)

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/02/19/03/2018 හා 2018.12.14 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

# මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
# நிதி மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு
# MINISTRY OF FINANCE AND ECONOMIC AFFAIRS

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/PC/Circular/2018
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018.11.19

**රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක: 06/2018**

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්**
**සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්**

**<u>රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන කටයුතුවලදී දේශීය ණයවර ලිපි විවෘත කිරීම</u>**

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සිදු කරනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනවලදී, ගෙවීම් කොන්දේසියක් වශයෙන් දේශීය ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය වේ. මෙම තත්ත්වය දිගින් දිගටම අනුගමනය කිරීම මගින් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් ප්‍රවාහයට මෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා අහිතකර බලපෑමක් ඇති කරයි.

02. එබැවින්, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සිදු කරනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනවලදී ඊට අදාළව සකස් කරනු ලබන ලංසු ලේඛනවල මින් ඉදිරියට "දේශීය ණයවර ලිපි විවෘත කිරීම මගින් ගෙවීම් කිරීම" ගෙවීම් කොන්දේසියක් වශයෙන් ඇතුළත් කිරීම, මහා භාණ්ඩාගාරයේ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පූර්ව එකඟතාවයක් නොමැතිව සිදු නොකළ යුතුය.

03. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2484729 ඔස්සේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ දුරකථන අංක 011-2484994 ඔස්සේ එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඇමතීම මගින් ලබාගත හැකි වේ.

**එස්.ආර්. ආටිගල**
**භාණ්ඩාගාරයේ ලේකම්**

පිටපත: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
04. විගණකාධිපති